සැ. යු. - 2011.08.12 දින පළ වූ අංක 1719 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවිය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,720 - 2011 අගෝස්තු මස 19 වැනි සිකුරාදා - 2011.08.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1066 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1071 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1073 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 අගෝස්තු මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 අගෝස්තු මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1065 - B 80352 — 7,100 (2011/08)
F 1 – (S/E)

# තනතුරු - ඇබෑර්තු

## මීගමුව මහ නගර සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

මීගමුව මහ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මීගමුව" යන ලිපිනයට 2011.09.19 දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | ආදායම් පරිපාලක II ශ්‍රේණිය | 01 | **MN1-2006A** ආරම්භක වැටුප් පියවර රු. 13,120 4 වැනි පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි | (සටහන 01 බලන්න) |
| 02 | සෞඛ්‍ය පරිපාලක II ශ්‍රේණිය | 01 | **MN1-2006A** ආරම්භක වැටුප් පියවර රු. 13,120 4 වැනි පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි | (සටහන 02 බලන්න) |
| 03 | විදුලි කම්බිකරු (ශිල්පීය) | 01 | **PL3 - 2006A** ආරම්භක වැටුප් පියවර රු. 12,470 4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි | (සටහන 03 බලන්න) |
| 04 | ගල්රෝල් රියැදුරු (ශිල්පීය) | 02 | **PL3 - 2006A** ආරම්භක වැටුප් පියවර රු. 12,470 4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි | (සටහන 04 බලන්න) |

***සටහන 01 - ආදායම් පරිපාලක තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් :***

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ශුද්ධ ගණිතය, වාණිජ අංක ගණිතය/ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම හා බස්නාහිර පළාත තුළ පළාත් පාලන ආයතනයක වසර 05ක සේවා කාලයක් සහිත ස්ථිර තනතුරක් දරන්නකු වීම.

හෝ

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ශුද්ධ ගණිතය, වාණිජ අංක ගණිතය/ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 05කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම

**සටහන 02 - සෞඛ්‍ය පරිපාලක II ශ්‍රේණිය තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් :**

සිංහල /දෙමළ සහ ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය ස්වස්ථතාව හා ශාරීරික විද්‍යාව/සෞඛ්‍ය විද්‍යාව/විද්‍යාව ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් 05කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත් වී තිබීම.

හෝ

සිංහල/දෙමළ සහ ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය, ස්වස්ථතාව හා ශාරීරික විද්‍යාව/විද්‍යාව ඇතුළුව විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සාමාර්ථය ලබා සිටින පළාත් පාලන ආයතනයක ස්ථිර තනතුරක් දරන්නකු ;

හෝ

පළාත් පාලන ආයතනයක අවුරුදු 10ට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 08 වැනි පන්තියේ සාමාර්ථය ලබා තිබීම.

**සටහන 03 — විදුලි කම්බිකරු (ශිල්පීය) තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් :** ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී කුමන හෝ විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06කින් සමත්වී තිබීම. මින් විෂයයන් 05ක් එකවරක දී සමත්වී තිබිය යුතුය ;

සහ

තනතුරට අදාළව අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)

*වෘත්තීය සුදුසුකම් .-* වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වැනි මට්ටමේ සහතිකය ලබා තිබීම;

හෝ

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.

හෝ

ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම ;

හෝ

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම

හෝ

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබාතිබීම

හෝ

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම;

**සටහන 04 - ගල්රෝල් රියැදුරු තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් .-** ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්වී තිබීම. මින් විෂයයන් 05ක් එකවරක දී සමත් වී තිබිය යුතුය ;

සහ

තනතුරට අදාළව අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)

*වෘත්තීය සුදුසුකම් .-* පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබාතිබීම.

*සේවා කොන්දේසි හා නියමයන් :-*

(අ) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ආ) වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ඇ) තෝරාගනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළ දී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලබයි. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර 01ක වැඩ බැලීමේ කාලයකට යටත් කර බඳවා ගනු ලැබේ.

*වෙනත් පොදු කොන්දේසි :-*

01. අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලනොපානු ඇත.).

02. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.

03. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

04. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

05. අයදුම්පත් කැඳවන දින වන විට පූර්වාසන්න වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචියක් තිබිය යුතුය.

06. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :-*

01. විදුලි කම්බිකරු සහ ගල්රෝල් රියැදුරු තනතුරු සඳහා සුදුසුකම් සපුරන අයදුම්කරුවන් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර ඉන් ලබාගන්නා කුසලතාවය මත පවත්නා පුරප්පාඩු පුරවනු ලැබේ.

02. ආදායම් පරිපාලක හා සෞඛ්‍ය පරිපාලක තනතුරුවලට බඳවා ගනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 ප්‍රකාර ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මතවේ. ලිඛිත පරීක්ෂණය, සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක් හා සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන පැය 01 ක ප්‍රශ්න පත්‍රයකින් සමන්විතවේ.

නාගරික කොමසාරිස්.
මීගමුව.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***මීගමුව මහ නගර සභාව***

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

-------------------------*තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම :————————,
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————,
03. ජාතික හැඳුනුම්පත් අංකය :————————,
04. ස්ථිර පදිංචි ලිපිනය:————————,
05. තැපැල් ලිපිනය:————————,
06. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:————————,
07. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:————————,
08. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතනන බල ප්‍රදේශය:————————,
09. උපන් දිනය:————————,
10. 2011.09.19 දිනට වයස:————————,
11. අධ්‍යාපන සුදුසුකම්:————————,
12. පළපුරුද්ද:————————,
13. වෘත්තීය සුදුසුකම්:————————,
14. වෙනත් සුදුසුකම්:————————,
15. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවකු කර තිබේ ද යන වග:————————,

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමට හා බඳවා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව හොඳාකාරවම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————

**දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන --------------------- මහතා/මිය./මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ---------------------- වශයෙන් සේවය කරයි. මෙම තනතුරු සඳහා ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි./නොකරමි.

————————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————————,
තනතුර:————————,
දිනය:————————,

08-490

**මහරගම නගර සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

මහරගම නගර සභාවේ පුරප්පාඩු වී ඇති, බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත දැක්වෙන තනතුරු සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01 *තනතුර හා වැටුප් පරිමාණය* — *අධ්‍යාපන සුදුසුකම්*

1. ආදායම් පරිපාලක II
මාසික : රු. 13,120-10x145-11x170-10x240-10x320= රු.22,040 MN-1-2006-A
හතරවැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.
තනතුරු 01

*(අ)* ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ශුද්ධ ගණිතය, වාණිජ අංක ගණිතය/ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම හා බස්නාහිර පළාත තුළ පළාත් පාලන ආයතනයක වසර 05ක සේවා කාලයක් සහිත ස්ථිර තනතුරක් දරන්නකු වීම ;

හෝ

*(ආ)* ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ශුද්ධ ගණිතය, වාණිජ අංක ගණිතය/ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 05කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත පරීක්ෂණය :-

*(අ)* සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක් ;

හා

*(ආ)* සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම සඳහා වන පැය 01ක ප්‍රශ්න පත්‍රයක්.

*සම්මුඛ පරීක්ෂණය* :- රා. ප. ච. 15/90 අදාළ වන පරිදි ලිඛිත පරීක්ෂණයක් මගින් තීරණය වන කුසලතාවය මත පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

2. පුස්තකාල කම්කරු III
මාසික : රු. 11,730-10x120-10x130-10x145-12x160= රු.17,600 (රා.ප.ච. 6/2006 (iv) හි PL-1-2006-A
හතරවැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.
තනතුරු 02

*(අ)* අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/ 9 වසර සමත්වීම.

3. සෞඛ්‍ය කම්කරු III
මාසික : රු. 11,730-10x120-10x130-10x145-12x160= රු.17,600 (රා.ප.ච. 6/2006 (iv) හි PL-1-2006-A)
හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.
තනතුරු 01

*(ආ)* අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ.

*බඳවා ගන්නා ක්‍රමය .-* රා. ප. චක්‍රලේඛ 24/95 විධිවිධාන අනුව බඳවා ගැනීම සිදු කෙරේ.

02. *පොදු සුදුසුකම් :-*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතු ය ;

(ii) අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය ;

(iii) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු යි ;

(iv) ඉල්ලුම්පත් භාරගැනීමේ අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.).

*03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු අනත්දරු /වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල යටතේ දායක මුදල් ගෙවිය යුතු වේ.

(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වේ.

(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාතේ පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හෝ රෙගුලාසිවලට ද, පළාත් පාලන ආයතනයට අදාළ ආඥාපනත්/පනත්වල විධිවිධානවලට ද, මහරගම නගර සභාව විසින් වරින් වරට නිකුත් කරන ලද/ ලබන නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතු ය.

04. *ඉල්ලුම් කළ යුතු ආකාරය :-*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2011.09.19 දිනට පෙර "ලේකම්, මහරගම නගර සභාව, මහරගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ."................................ තනතුර සඳහා අයදුම්පත" (තනතුරේ නම) යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතුයි.)

ඊ. එල්. කේ. එරබද්ද මිය.
ලේකම්,
මහරගම නගර සභාව.

2011 ක් වූ අගෝස්තු මස 02 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවය- මහරගම නගර සභාව*

*....................................... තනතුර සඳහා බඳවා ගැනීම*

1. මුලකුරු සමග නම :——————————,
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————,

2. ස්ථිර ලිපිනය :——————————,

3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.

4. දුරකථන අංකය :——————————.

5. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.

6. උපන් දිනය :
   වර්ෂය :——————————, මාසය :——————————, දිනය :——————————.

7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
   අවුරුදු :———————, මාස :———————, දින :———————.

8. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.

9. විවාහක/අවිවාහක බව :——————————.

10. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වන්නේ උපතින්ද ? ලියාපදිංචි වීමෙන් ද?:——————————,

11. අධ්‍යාපන සුදුසුකම් :

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගය :
සමත් වර්ෂය හා විභාග අංකය:——————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

(ii) අවසන්වරට සමත් වූ ශ්‍රේණිය :——————————.

12. වෙනත් සුදුසුකම්:——————————.

13.. සේවා පළපුරුද්ද :

13.1 දැනට සේවය කරන ආයතනය:——————————.
13.2 දැනට දරන තනතුර :——————————.
13.3 එම තනතුරට පත් වූ දිනය:——————————.
13.4 මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර:——————————.

14. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් මෙහි සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් විභාගයට පෙර හෝ පසුව මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බව ද මම දනිමි.

——————,

අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු වන ...................................... මයා./මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ /ආයතනයේ ............................................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

——————,

දෙපාර්තමේන්තුවේ/ ආයතන ප්‍රධානියාගේ හෝ
බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

දිනය : ——————.
පදවි නාමය හා ආයතනය : ——————.

08-485

---

**මඩකලපුව මහ නගර සභාව**

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ ඇති දුරකථන ක්‍රියාකරු සඳහා පුරප්පාඩු පිරවීම

**ඉහත කරුණ සම්බන්ධ මා විසින් 2011.07.29 දින දරන *ගැසට් පත්‍රයේ* අංක 1717G - 635 IV:ආ) වගන්තියේ නිවේදනය සම්බන්ධව**

ඉහත සඳහන් පත්වීමට අදාළ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2011 සැප්තැම්බර් මස 19 වැනි දින දක්වා දීර්ඝ කරන ලදී.

ක. සිවනාදන්,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
මඩකලපුව.

2011 ක් වූ අගෝස්තු මස 02 වැනි දින,

08-461

---

# පළාත් පාලන නිවේදන

**දමන ප්‍රාදේශීය සභාව**

අන්තරාදායක සහ අප්‍රසන්න ව්‍යාපාර

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අගෝස්තු මස විසිතුන් වැනි දින අංක 520/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත්කර ඇති පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 21 වැනි ඛණ්ඩයේ පළමු වැනි ඡේදයේ විධිවිධාන ප්‍රකාර දමන ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන ව්‍යාපාර, වෙළඳ ව්‍යාපාර වශයෙන් ප්‍රකාශයට පත් කිරීමටත් එකී වෙළඳ ව්‍යාපාරවලින් බදු හා බලපත්‍ර ගාස්තු අයකිරීමටත් දමන ප්‍රාදේශීය සභාව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඩී. වීරසිංහ,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව,
හිඟුරාණ.

2011 ජූලි මස 15 වැනි දින,
දමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*අන්තරාදායක ව්‍යාපාර :*

01. කබොක්, බොරළු හෝ කළුගල් කැනීම.
02. සිසිල් බීම නිෂ්පාදනය.
03. අයිස් නිපදවීම.

.04. ගැලුම් 50ට වැඩි ප්‍රමාණයක් පොල්තෙල් ගබඩාකර තබා ගැනීම
05. පිදුරු ගබඩාකර තබා ගැනීම
06. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම
07. යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම
08. අතින් ලී ඉරන ඉරුම්හලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම
09. දැව ගබඩාවක් පවත්වාගෙන යාම
10. යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන කම්හලක් පවත්වාගෙන යාම
11. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම
12. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොන්ඩර කිසියම් ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
13. බයිසිකල් හා මෝටර් බයිසිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩපළක් පවත්වාගෙන යාම
14. අළුත් හෝ පාවිච්චිකරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
15. විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම

*II වැනි කොටස*

*අප්‍රසන්න ව්‍යාපාර :*

16. කුකුළන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුළු ගාලක් හෝ කුකුළු කොටුවක් පවත්වාගෙන යාම
17. බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා කොටුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම
18. තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන කෑම සුළු කෑම, වර්ග ගබඩා කර තැබීම
19. සිමෙන්ති හොන්ඩර 25ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
20. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම
21. වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
22. සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම
23. රස කැවිලි වර්ග නිපදවීම
24. පැණි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම
25. යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාංශ බෝග කෙටීම
26. පළතුරු හෝ මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම
27. ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
28. ශීතකල මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම
29. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම

*III වැනි කොටස*

30. බැටරි චාජ් කිරීම හෝ අළුත්වැඩියා කිරීම
31. වැල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
32. මෝටර් වාහන සඳහා සර්විස් කිරීම හෝ අළුත් වැඩියා කිරීම සඳහා වැඩපළක් පවත්වාගෙන යාම
33. පෙට්‍රල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම
34. පෙට්‍රල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
35. මොටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යාම
36. විදුලි කර්මාන්ත වැඩපළක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත් වැඩියාකරන වැඩපළක් හෝ විදුලි යන්ත්‍ර නිපදවන වැඩපළක් පවත්වාගෙන යාම
37. හුණු පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

08-405/4

---

**ගෝඝාතක ආඥාපනත - (272 අධිකාරිය)**

මෙහි උපලේඛනයේ සඳහන් ස්ථානයන් හි 2011 වර්ෂය ආරම්භයේ සිට මස් පිණිස ගවමස් විකිණීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට තීරණය කර ඇත.

මෙම තීරණය ගැන දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත ලේඛනගත තැපෑලෙන් මා වෙත එවිය යුතු බව ගෝඝාතක ආඥාපනතේ (272) අධිකාරියේ 7 (11) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්. ඩී. වීරසිංහ,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව
හිඟුරාණ.

2011 ජූලි මස 15 වැනි දින,
දමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| | වෙළඳාමේ ස්වභාවය | වෙළඳාම පවත්වාගෙන යන ස්ථානය |
|---|---|---|
| 01. | ගව මස් පිණිස | හිඟුරාණ නගරය |

08-405/5

**දමන ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂය සඳහා වරිපනම් බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වැනි සහ 134(2) වැනි වගන්ති ප්‍රකාර, හිඟුරාණ කරලැව ග්‍රාම නිලධාරී වසම තුළ දියුණු ගම් ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති කොටසේ පිහිටි නිශ්චල දේපළ වලින් වාර්ෂික වටිනාකමින් සියයට හතක (7%) වරිපනම් බද්දක් 2011 වර්ෂය සඳහා පනවා 2011 මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 සහ දෙසැම්බර් මස 31 වැනිදායින් අවසන් වන අයුරු කාර්තු 04කින් අය කර ගැනීමට තීරණය කරන බවත්, එකී කාර්තු අවසාන වීමට පෙර ගෙවිය යුතු බව ද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

තව ද එකී පනතේ 134(7) වගන්තිය ප්‍රකාරව යම් වාර්ෂික බද්දක් හෝ අක්කර බද්දක් පහත සඳහන් පරිදි සම්පූර්ණයෙන් ගෙවූ විට එහි දැක්වෙන වට්ටම් ප්‍රදානය කරන බව ද වැඩි දුරටත් දැනුම් දෙමි.

එනම්,

(අ) 2011 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම සම්පූර්ණ වර්ෂයට ම ගෙවිය යුතු සම්පූර්ණ වරිපනම් බද්ද හෝ අක්කර බද්දක් ගෙවනු ලැබුවහොත් ගෙවන ලද එම මුදලින් සියයට දහයක (10%) වට්ටමක් ද,

(ආ) අක්කර බද්ද හෝ වරිපනම් බදු මුදල කොටස් වශයෙන් ගෙවන විට වරිපනම් බද්ද හෝ අක්කර බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමුවන මාසය තුළ ගෙවනු ලැබුවහොත් එසේ ගෙවනු ලබන මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද බදු ගෙවන්නන්ට දෙනු ලබන අතර,

නියමිත කාර්තු තුළ දී හෝ ඊට පසු මසක සහන කාලය ඇතුළත දී නියමිත වරිපනම් බදු නොගෙවන අයගේ එකී පනතේ 16(අ) වැනි වගන්තියෙන් දක්වා ඇති ආකාරයට සියයට දහයක (10%) වරෙන්තු ගාස්තුවක් අයකරනු ලබන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්. ඩී. වීරසිංහ,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව
හිඟුරාණ.

2011 ජූලි මස 15 වැනි දින,
දමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

08-405/6

---

**දමන ප්‍රාදේශීය සභාව**

විනෝද බදු ආඥාපනත යටතේ බදු අය කිරීම

2011 වර්ෂය විනෝද බදු ආඥාපනත යටතේ සෑම චිත්‍රපට දර්ශනයක් ආධාර චිත්‍රපට දර්ශනයක් සර්කස් දර්ශනයක් හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම නිකුත් කරනු ලබන ඇතුළත්වීමේ ගාස්තුවෙන් 10% ක බද්දක් පනවා අයකරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඩී. වීරසිංහ,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව
හිඟුරාණ.

2011 ජූලි මස 15 වැනි දින,
දමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

08-405/3

---

# විවිධ දැන්වීම්

**දමන ප්‍රාදේශීය සභාව**

සුසාන භූමි ආඥාපනත (231 වැනි අධිකාරය)

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වැනි වගන්තිය හා (231 වැනි අධිකාරයේ) සුසානභූමි හා භූමිදාන ආඥාපනතේ 3 වැනි වගන්තියේ හා 17 සිට 22 වගන්ති අනුව සඳහන් කාර්යයන් සඳහා එකී ආඥා පනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මතු දැක්වෙන උපලේඛනයේ සඳහන් සුසාන භූමිවල තැන්පත් කිරීමක් හා ස්මාරකයක් ඉදිකිරීමක් සඳහා ගාස්තු 2003 ජනවාරි මස 01

වැනි දින සිට පනවා අය කිරීමට 1995.01.25 වැනි දින ප්‍රාදේශීය සභාවේ පැවති මාසික සභා රැස්වීමේ දී ඒකච්ඡන්දයෙන් සභා සම්මත කරගත් මෙම තීරණය තවදුරටත් ඉදිරි වර්ෂ සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1995.05.18 වැනි දින තීරණය කර ඇති බව නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඩී. වීරසිංහ,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව,
හිඟුරාණ.

2011 ජූලි මස 15 වැනි දින,
දමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | *සොහොන් පිටියේ නම* | *තැන්පත් කිරීමක් සඳහා වයස් සීමාවකින් තොරව උපරිම වර්ග අඩි රු. ශත* | *ස්මාරකයක් ඉදිකිරීම සඳහා වයස් සීමාවකින් තොරව උපරිම වර්ග අඩි රු. ශත* |
|---|---|---|---|
| 01. | උක්සිරිපුර (හිඟුරාණ) සුසාන භූමිය | 400 0 | 400 0 |
| 02. | සමගිපුර (හිඟුරාණ) සුසාන භූමිය | 400 0 | 400 0 |
| 03. | 31 ජනපදයේ සුසාන භූමිය | 200 0 | 200 0 |
| 04. | කරාන පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 05. | කෙත්සිරිගම පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 06. | පල්ලන්ඔය පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 07. | දේවාලහිඳ පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 08. | මීගහපල්ලම පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 09. | 18 ඒ ජනපදය පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 10. | මහානාගපුර පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 11. | තිඹිරිගොල්ල පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 12. | පන්නල්ගම පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 13. | පන්නල්ගම 2සී ජනපදයේ පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 14. | කීනවත්ත පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 15. | හෙලගම්පුර පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 16. | මොරලහපල්ලම පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 17. | පහලලන්ද පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 18. | ගල්කන්ද පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 19. | දමන පැරණිගම පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 20. | දෙමැටැල්ල පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 21. | හිඳකළුගම පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 22. | එග්ගල්ඔය පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 23. | 19ඒ ජනපදය පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 24. | තොට්ටම පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 25. | මඩාන පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 26. | මඩවලලන්ද 26ඒ ජනපදය පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 27. | අම්බලන්ඔය ගම පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 28. | මලයාඩිය පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |
| 29. | ජයන්තිපුර වඩිනාගල පොදු සුසාන භූමිය | 200 0 | 200 0 |

08-405/9

---

**දමන ප්‍රාදේශීය සභාව**

බලපත්‍ර ගාස්තු හා බදු පැනවීම - 2011

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149, 150(1), (2), 152 (1) සහ (2) යන වගන්තිය යටතේ දමන ප්‍රාදේශීය සභාව පහත සඳහන් උපලේඛන වල දැක්වෙන පරිදි බලපත්‍ර ගාස්තු හා බදු මුදල් සෑම වර්ෂයකම ජූනි මස 30 වැනි දිනට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ. තක්සේරු නොකරන ලද ස්ථාන වෙනුවෙන් වාර්ෂිකව තක්සේරුව රු. 1,500 ක් සේ සලකා බලපත්‍ර ගාස්තු හා බදු මුදල් අය කරනු ලැබේ.

ඩබ්. ඩී. වීරසිංහ,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව
හිඟුරාණ.

2011 ජූලි මස 15 වැනි දින,
දමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*පළමුවැනි උපලේඛනය*

| | *I වැනි තීරුව* *ව්‍යාපාරයේ ස්වභාවය* | *II තීරුව* *වාර්ෂික වටිනාකම රු. 750 දක්වා* | *වාර්ෂික රු. 750 සිට රු. 1,500 දක්වා* | *වාර්ෂික වටිනාකම රු. 1,500 වැඩි* |
|---|---|---|---|---|
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | කුළුබඩු විකිණීම සඳහා සාප්පුවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 1,000 0 | 1,500 0 |
| 02. | භෝජනාගාරයක් හෝ භෝජන ශාලාවක් පවත්වාගෙන යාම සඳහා | 800 0 | 1,000 0 | 1,200 0 |
| 03. | බේකරියක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 850 0 | 1,000 0 |
| 04. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම සඳහා | 400 0 | 600 0 | 800 0 |
| 05. | ශීත කරන ලද මස් හෝ මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 850 0 | 1,000 0 |
| 06. | කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 800 0 | 1,000 0 |
| 07. | නවාතැන් ගන්නා ස්ථානයක් සඳහා | 1,500 0 | 2,500 0 | 3,000 0 |
| 08. | හුණු පෝරණුවක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 600 0 | 750 0 |
| 09. | ස්ථර දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම වර්ග අඩියකට | 100 0 | | |
| 10. | දැන්වීම් පුවරු (බැනර් සහ කටවුට්) තාවකාලිකව ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට | 40 0 | | |
| 12. | පැණි ලීටර් 200 වඩා විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 13. | මුදවන ලද මී කිරි වෙළඳාම් කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | පෙට්‍රල්, ඩීසල් හෝ වෙනත් ඛණිජ තෙල් ගබඩා කිරීම හෝ විකිණීම සඳහා | 1,000 0 | 2,500 0 | 3,000 0 |
| 15. | ආගමික කටයුතු වලට හැර අනෙකුත් කටයුතු සඳහා ශාලාවක් කුළියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 750 0 |
| 16. | පළතුරු විකිණීමේ ස්ථානයක් සඳහා | 400 0 | 500 0 | 750 0 |
| 17. | එළවළු විකිණීමේ ස්ථානයක් සඳහා (පොදු වෙළඳ පොළ දියුණු ප්‍රදේශය තුළ) | 500 0 | 600 0 | 750 0 |
| 18. | සජීවි සතුන් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 19. | සංචාරක වෙළෙන්දෙකු සඳහා | 400 0 | 500 0 | 600 0 |
| 20. | කළු ගල් පිපිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 1,500 0 | 2,500 0 | 3,000 0 |
| 21. | මිරිස්, පිටි, කෝපි හෝ ධාන්‍ය වර්ග කුළුබඩු හෝ මෑ වර්ග ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ගඩොල් හෝ උළු නිපදවීමේ හෝ පිළිස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 23. | යන්ත්‍ර මගින් ක්‍රියා කරන ලී මෝලක් පවත්වාගෙන යාම සඳහා | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 24. | යකඩ කම්හලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 600 0 | 800 0 |
| 25. | බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 850 0 |
| 26. | කම්හලක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 800 0 | 1,000 0 |
| 27. | බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 800 0 | 1,000 0 |
| 28. | ශබ්ද විකාශන යන්ත්‍ර තබා ගැනීම හෝ කුලියට දීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 29. | වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | බයිසිකල් වෙළඳාම් කරන ස්ථානයක් | 600 0 | 800 0 | 1,000 0 |
| 31. | පාපැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 600 0 | 800 0 |
| 32. | මෝටර් සයිකල් විකිණීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 | 1,500 0 |
| 33. | ආගන්තුක නිවාස (නවාතැන් ගන්නා රෙස්ට් හවුස්) පවත්වාගෙන යාම සඳහා | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 34. | ඡායා පිටපත් ගැණීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් සඳහා | 700 0 | 800 0 | 1,000 0 |
| 36. | වඩුවැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 37. | බෙලෙක් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 600 0 | 800 0 |
| 38. | විදුලි උපකරණ හෝ රේඩියෝ අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 600 0 | 800 0 |
| 39. | දර රැස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 400 0 | 500 0 | 600 0 |
| 40. | යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා | 800 0 | 1,000 0 | 1,200 0 |
| 41. | කොණ්ඩා කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 850 0 |
| 42. | රස කැවිලි නිෂ්පාදනය හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 600 0 | 700 0 |
| 43. | යකඩ බඩු ගබඩාවක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 | 1,500 0 |
| 44. | ලියවන පට්ටලයක් භාවිතා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 45. | ඇළුමිනියම් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 600 0 | 800 0 |
| 46. | සිමෙන්ති විකිණීම සඳහා ගබඩාකර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 1,500 0 | 2,000 0 | 1,000 0 |
| 47. | ග්‍රොස් එකකට වැඩි සිසිල් බීම ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| | I වැනි තීරුව<br>ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 දක්වා | II තීරුව<br>වාර්ෂික රු. 750 සිට රු. 1,500 දක්වා | වාර්ෂික වටිනාකම රු. 1,500 වැඩි |
|---|---|---|---|---|
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 48. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 600 0 | 700 0 |
| 49. | ගැලුම් පන්දාහට වඩා වැඩි පොල් තෙල් විකිණීම සඳහා | 400 0 | 500 0 | 750 0 |
| 50. | විසිරු පින්තාරු (ස්ප්‍රේ පේන්ටින්) ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 800 0 |
| 51. | මෝටර් වාහන සඳහා බෝඩි සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 52. | තොග වශයෙන්, හාල් පිටි හෝ ලුණු කිලෝ 750ට වැඩියෙන් විකිනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 800 0 | 1,000 0 |
| 53. | පිත්තල භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 800 0 |
| 54. | සාප්පු බඩු වෙළඳාම් කරන ස්ථානයක් සඳහා | 700 0 | 1,000 0 | 2,000 0 |
| 55. | රෙදිපිළි සාප්පුවක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | මෝටර් රථ, මෝටර් සයිකල් අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 800 0 | 1,000 0 | 1,200 0 |
| 57. | රේඩියෝ අමතර කොටස් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 800 0 | 1,000 0 | 1,500 0 |
| 58. | පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 700 0 | 1,000 0 | 1,200 0 |
| 59. | අවමංගල්‍ය භාණ්ඩ විකිණීමේ හා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 800 0 | 1,000 0 | 1,500 0 |
| 60. | ස්වර්ණාභරණ වෙළඳ සැලක් පවත්වාගෙන යාම සඳහා | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 61. | ආයුර්වේද බෙහෙත් බඩු වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 800 0 | 1,000 0 |
| 62. | ඉංග්‍රීසි බෙහෙත් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 | 1,500 0 |
| 63. | ලිපි ද්‍රව්‍ය වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 64. | පොත් සාප්පුවක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 800 0 | 1,000 0 |
| 65. | ඩිස්පැන්සරියක් පවත්වාගෙන යාම සඳහා (බටහිර වෛද්‍ය) | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | ඩිස්පැන්සරියක් පවත්වාගෙන යාම සඳහා (ආයුර්වේද වෛද්‍ය) | 300 0 | 500 0 | 700 0 |
| 67. | බුලත් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 800 0 | 1,000 0 |
| 68. | විදුලි උපකරණ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 800 0 | 1,000 0 | 1,200 0 |
| 69. | මත්පැන් තොග වශයෙන් (රට බීම) ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 70. | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 800 0 | 1,000 0 | 1,200 0 |
| 71. | කාර්පට් කුෂන් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 800 0 | 1,000 0 | 1,500 0 |
| 72. | රබර් මිශ්‍ර මෙට්ට හෝ ෂීට් විකිණීමේ ස්ථානයක් සඳහා | 800 0 | 1,000 0 | 1,500 0 |
| 73. | ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 74. | විශේෂ වෛද්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 | 1,500 0 |
| 75. | කිරි ශාලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 76. | ඔර්ලෝසු අළුත්වැඩියා කරන ස්ථානයක් සඳහා | 500 0 | 600 0 | 800 0 |
| 77. | ඔර්ලෝසු විකිණීමේ වෙළඳසැලක් සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 78. | පටිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 800 0 | 1,000 0 |
| 79. | මහන මැෂින්වලින් ඇඳුම් මැසීමේ ස්ථානයක් සඳහා | 500 0 | 800 0 | 1,000 0 |
| 80. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම සඳහා | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 81. | ශීත කරන ලද මස් හෝ මාළු වෙළඳාම් සඳහා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 82. | වාහන සර්විස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 1,500 0 | 2,000 0 | 3,000 0 |
| 83. | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 800 0 | 1,000 0 |
| 84. | අයිස්ක්‍රීම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 800 0 | 1,000 0 |
| 85. | කෘතිම පොහොර නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 86. | පිඟන් සහ වීදුරු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 800 0 | 1,000 0 |
| 87. | වැල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම සඳහා | 800 0 | 1,000 0 | 1,500 0 |
| 88. | බිත්තර හෝ මස් පිණිස කුකුලන් ඇති කිරීම සඳහා | 750 0 | 1,000 0 | 1,500 0 |
| 89. | වීඩියෝ චිත්‍රපට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 90. | ටියුෂන් පන්ති (පුද්ගලික පාසැල් ඇතුළුව) | 500 0 | 1,000 0 | 1,500 0 |
| | ළමයින් 10 සිට 25 දක්වා | 500 0 | | |
| | ළමයින් 25 සිට 50 දක්වා | 800 0 | | |
| | ළමයින් 50 වැඩි | 1,000 0 | | |
| 91. | ටයර් ටියුබ් විකිණීමේ ස්ථානයක් සඳහා (මෝටර් වාහන සඳහා) | 500 0 | 800 0 | 1,000 0 |
| 92. | ටයර් ටියුබ් විකිණීමේ ස්ථානයක් සඳහා (පා පැදි යතුරු පැදි) වර්ග සඳහා | 400 0 | 600 0 | 800 0 |
| 93. | කිරිපිටි වර්ග බිස්කට් ආදිය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 600 0 | 800 0 |

| | I වැනි තීරුව | II තීරුව | | |
|---|---|---|---|---|
| | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 දක්වා | වාර්ෂික රු. 750 සිට රු. 1,500 දක්වා | වාර්ෂික වටිනාකම රු. 1,500 වැඩි |
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 94. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම සඳහා (අතින් ක්‍රියා කරන) | 500 0 | 800 0 | 1,000 0 |
| 95. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම සඳහා (විදුලියෙන් ක්‍රියා කරන) | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 96. | මිනී පෙට්ටි විකිණීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් සඳහා | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 97. | පුවත්පත් විකිණීමේ හෝ බෙදා හැරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 600 0 | 800 0 |
| 98. | දත් බදින ස්ථානයක් හෝ ගලවන ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 99. | බෙලෙක් වැඩපලක් සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 100. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 101. | සරුවත් හෝ සිසිල් බීම වෙළඳසැලක් සඳහා | 400 0 | 600 0 | 750 0 |
| 102. | වී කෙටීමේ ස්ථානයක් (වී මොලක්) | | | |
| | අ. බ. 3 සිට 7 1/2ක් දක්වා | 1,000 0 | | |
| | අ. බ. 7 1/2 සිට 10 දක්වා | 1,500 0 | | |
| | අ. බ. 10 ට වැඩි | 2,500 0 | | |
| 103. | ගෘහ භාණ්ඩ විකිණීමේ වෙළඳ සැලක් සඳහා | 750 0 | 850 0 | 1,000 0 |
| 104. | ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් සඳහා | 750 0 | 850 0 | 1,000 0 |
| 105. | සුවඳ විලවුන් වර්ග හා පවුඩර් වර්ග විකිණීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 800 0 |
| 106. | පළතුරු වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 600 0 | 700 0 |
| 107. | යකඩ ග්‍රිල් ගේට්ටු, යකඩ ග්‍රිල් වැටවල් හා අනෙක් ග්‍රිල් වැටවල් නිෂ්පාදනය කරන ස්ථාන සඳහා | 800 0 | 1,500 0 | 2,000 0 |
| 108. | රියදුරු පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 109. | සංචාරක අයිස් ක්‍රීම්, රස කැවිලි හා මාළු වර්ග වෙළඳාම් කිරීම සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 110. | ඛනිජ තෙල් ගබඩා කර විකිණීම (ලී. 200ට අඩු) | 500 0 | | |
| 111. | ඛනිජ තෙල් ගබඩා කර විකිණීම (ලී. 200 සිට 500 දක්වා) | 800 0 | | |
| 112. | ඛනිජ තෙල් ගබඩා කර විකිණීම (ලී 800 වැඩි) | 1,500 0 | | |
| 113. | යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන උක් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 114. | මැටි භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් සඳහා | 500 0 | 800 0 | 1,000 0 |
| 115. | මෝටර් වාහන අළුත්වැඩියාව සඳහා වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 800 0 | 1,000 0 | 1,500 0 |
| 116. | බටහිර ඖෂධ වර්ග වෙළඳාම් කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 117. | පින්තාරු තීන්ත, වාර්නිෂ්, ඩිස්ටැම්පර් හා සායම් වර්ග විකිණීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 | 1,500 0 |
| 118. | සිමෙන්ති භාණ්ඩ මල් පෝච්චි නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 800 0 |
| 119. | වී තැම්බුම හෝ සහල් සැකසීමේ මධ්‍යස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 850 0 |
| 120. | ලී විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 121. | කුළු බඩු පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 800 0 |
| 122. | කෘෂි රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් සඳහා | 800 0 | 1,000 0 | 1,500 0 |
| 123. | වී මෝලක් පවත්වාගෙන යාම සඳහා (අ. බ. 1 සිට 7 1/2 දක්වා (ඛණිජ තෙල් මඟින් ඩීසල්) | 750 0 | 850 0 | 1,000 0 |
| 124. | මත්පැන් විකිණීමේ ඇතුළුව ආපනශාලාවක් පවත්වාගෙන යාම (සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 125. | වී මෝලක් පවත්වාගෙන යාම සඳහා (අ. බ. 7 1/2 සිට 10 දක්වා) | 1,500 0 | 2,000 0 | 2,500 0 |
| 126. | වී මෝලක් පවත්වාගෙන යාම සඳහා (අ. බ. 10 වැඩි) | 2,000 0 | 25,000 0 | 3,000 0 |
| 127. | ලොතරැයි විකිණීමේ හෝ නියෝජිත ආයතනයක් සඳහා | 1,250 0 | 1,500 0 | 2,000 0 |
| 128. | විඩියෝ චිත්‍රපට පෙන්වීමේ ස්ථානයක් සඳහා | 750 0 | 850 0 | 1,000 0 |
| 129. | පරණ යකඩ බඩු රැස්කර ගැනීමේ ස්ථානයක් සඳහා | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 130. | පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් හෝ වෙනත් ඛනිජ තෙල් ගබඩා කිරීම හෝ විකිණීම සඳහා (ගැළුම් 150ට අඩු) | 750 0 | 1,000 0 | 1,500 0 |
| 131. | බිරළු ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 800 0 | 1,000 0 |
| 132. | විකිණීම සඳහා පොහොර ගබඩා කිරීම | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 133. | එළු සහ ඌරු කොටු ගාලක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 | 1,500 0 |
| 134. | ස්වර්ණාභරණ නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 1,000 0 | 1,500 0 |
| 135. | යන්ත්‍රානුසාරයෙන් මිරිස් හා ධාන්‍ය වර්ග අඹරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 136. | වළං නිෂ්පාදනය කරන ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 850 0 |
| 137. | ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර, ඔරලෝසු අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා | 750 0 | 850 0 | 1,000 0 |

| | පළමු වැනි තීරුව ව්‍යාපාරයේ ස්වභාවය | දෙවැනි තීරුව වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත | වාර්ෂික රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,500 වැඩි රු. ශත |
|---|---|---|---|---|
| 138. | වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 139. | රථ වාහන සර්විස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා (ත්‍රීවිල් රථ යතුරු පැදි ) | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 140. | වෙළඳාම සඳහා පොත් පත් හා ලිපි ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා | 350 0 | 400 0 | 500 0 |
| 141. | දත් බැඳීමේ හා ගැලවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 142. | කැටයම් වැඩපලක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 500 0 | 750 0 |
| 143. | ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනි යන්ත්‍ර, ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා | 750 0 | 850 0 | 1,000 0 |
| 144. | වෙළඳාම සඳහා සෙල්ලම් බඩු ගබඩා කිරීම | 500 0 | 600 0 | 800 0 |
| 145. | අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 146. | මස් පිණිස කුකුළන් හා කිකිළියන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 850 0 | 1,000 0 |
| 147. | ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 700 0 | 800 0 | 1,000 0 |
| 148. | පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 350 0 | 400 0 | 500 0 |
| 149. | සත්වා ආහාර වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා | 400 0 | 500 0 | 750 0 |
| 150. | රස කැවිලි නිෂ්පාදනය කිරීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 151. | දේශීය හා විදේශීය දුරකථන ඇමතුම් ලබාගන්නා (පුද්ගලික) ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 152. | රෙදිපිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 153. | කිරි එකතු කරන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 800 0 | 1,000 0 |
| 154. | මනාලියන් හැඩ ගැන්වීම ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 | 1,500 0 |
| 155. | බටි කරන බෝග වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 156. | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරුම් හලක් පවත්වාගෙන යාම සඳහා | 1,500 0 | 2,500 0 | 3,000 0 |
| 157. | පැළ විකිණීමේ ස්ථානයක් සඳහා (මල් පළතුරු හෝ කෘෂි බෝග නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් සඳහා | 800 0 | 1,000 0 | 15,000 0 |
| 158. | ලී බඩු හෝ වානේ ගෘහ භාණ්ඩ නිපදවීම හෝ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 159. | පොල් අතු ගබඩා කිරීම හෝ විකිණීම් ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 850 0 |
| 160. | ඇග්‍රොටෙක් යන්ත්‍රයක් මගින් ගොයම් මැඩීම සඳහා | 500 0 | 600 0 | 700 0 |
| 161. | සංචාරක මිරිදිය හා කරදිය මාළු වෙළඳාම සඳහා | 400 0 | 500 0 | 600 0 |
| 162. | යන්ත්‍රානුසාරයෙන් කළුගල් කඩන ස්ථානයක් සඳහා | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 163. | ධාන්‍ය වර්ග සඳහා ඇඹරුම් හලක් පවත්වාගෙන යාම සඳහා (අ. බ. 7ට අඩු) | 500 0 | 750 0 | 1,000 0 |
| 164. | ත්‍රීවිල් රථ අළුත්වැඩියා කිරීම හා සේවා කිරීම සඳහා | 1,000 0 | 1,500 0 | 2,500 0 |
| 165. | ත්‍රී වීල් රථ සඳහා අමතර කොටස් වෙළඳාම් කරනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 1,500 0 | 2,000 0 |

08-405/1

---

## දමන ප්‍රාදේශීය සභාව

1980 අංක 47 දරන පාරිසරික පනත යටතේ පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු අයකිරීම - 2011 වර්ෂය

2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1159/22 දරන වර්ෂ 2000 ක් වූ නොවැම්බර් මස 22 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ "ආ" කොටසේ නියමිත ව්‍යාපාර ලෙස ප්‍රකාශිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් 2011.01.01 වැනි දින ක්‍රියාත්මක වන පරිදි ඉදිරියට වාර්ෂික බලපත්‍ර ලබා ගත යුතු වේ. මෙහි පහත සඳහන් මූලික ආයෝජනය මත පදනම් වන පරීක්ෂණ ගාස්තුවක්ද අයකරනු ලැබේ. පාරිසරික ආරක්ෂිත බලපත්‍රයක ගාස්තුව රු. 3,000ක් වේ. එම බලපත්‍රයේ උපරිම වලංගු කාලය අවුරුදු 03 වේ.

ඩබ්. ඩී. වීරසිංහ,<br>
සභාපති,<br>
දමන ප්‍රාදේශීය සභාව<br>
හිඟුරාණ.

2011 ජූලි මස 15 වැනි දින,<br>
දමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| | ආයෝජනය<br>රු. | පරීක්‍ෂා කිරීමේ ගාස්තු<br>රු. |
|---|---|---|
| 01. | 10,00,000 | 8,000 0 |
| 02. | 5,00,001 - 1,00,000 | 4,000 0 |
| 03. | 2,50,001 - 5,00,000 | 3,000 0 |
| 04. | 1,00,000 - 2,50,000 | 750 0 |
| 05. | 1,00,000 | 400 0 |

08-405/2

---

**රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද - 2011 වර්ෂය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය අනුව මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වාහන හා සතුන් පිළිබඳ බද්දක් 2011 වර්ෂය සඳහා නියම කර අය කිරීමට තීරණය කළ බවත් එකී පනතේ 148 (3) වැනි වගන්තිය ප්‍රකාර එකී බදු මුදල 2011 මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම මෙම සභාවට ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්. ඩී. වීරසිංහ,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව
හිඟුරාණ.

2011 ජූලි මස 15 වැනි දින,
දමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| | | රු. ශ. |
|---|---|---|
| 01. | මෝටර් රථයක්, මෝටර් සයිකලයක්, මෝටර් ලොරියක් මෝටර් ට්‍රයිසිකලයක් කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකයක් නොවන සෑම වාහනයක් සඳහාම - | 25 0 |
| 02. | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකලයක්, කාරයක් හෝ කරත්තයක් සඳහා | |
| | (අ) වෙළඳ කාර්යයක් සඳහා යොදා ගන්නේ නම් | 20 0 |
| | (ආ) වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදා ගන්නේ නම් | 4 0 |
| 03. | සෑම කරත්තයක් සඳහාම | 30 0 |
| 04. | සෑම අත්කරත්තයක් සඳහාම | 20 0 |
| 05. | සෑම ජින් රික්ෂෝවක් සඳහාම | 10 0 |
| 06. | සෑම අශ්වයෙකුම, පෝනියෙකුම, කොටළුවෙකු සඳහා | 25 0 |

08-405/7

---

**දමන ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ගොඩනැගිලි ඉදිකිරීම මත ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 21, 49, 78 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන අති විශෂෙ ගැසට් පත්‍රයේ iv(ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව (260 වැනි අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර 2011.01.01 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුල ගොඩනැගිලි ඉදිකිරීම් හා අනවසර ඉදිකිරීම් සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු නැවත සංශෝධනය කරන තුරු මෙම සභාවට අය කිරීමට තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශ කරමි.

තව ද මෙම සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන සියලුම ඉදිකිරීම් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් අයදුම්පතක් සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු බව මෙයින් දැනුම් දෙමි.

ඩබ්. ඩී. වීරසිංහ,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව,
හිඟුරාණ.

2011 ජූලි මස 15 වැනි දින,
දමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය 01*

*ගොඩනැගිලි ඉදිකිරීම*

| *ගෙබිම විශාලත්වය* | *පදිංචි සඳහා* | *වාණිජ හෝ වෙනත් භාවිතය* |
|---|---|---|
| *(ව. අ.)* | *රු. ශ.* | *රු. ශ.* |
| 500ට අඩු | 150 0 | 250 0 |
| 501 සිට 1,000 | 200 0 | 300 0 |
| 1001 සිට 2000 | 250 0 | 350 0 |
| 2001 සිට 3000 | 300 0 | 400 0 |
| 3001 සිට 4000 | 400 0 | 500 0 |
| 4001 සිට 5000 | 500 0 | 600 0 |
| 5000 සිට වැඩි වන සෑම වර්ග අඩි 1000 කටම | 750 0 | 1,000 0 |

*උපලේඛනය 02*

*අනවසර ඉදිකිරීම් සඳහා දඩ මුදල්*

| *ගෙබිම විශාලත්වය* | *පදිංචි සඳහා* | *වාණිජ හෝ වෙනත් භාවිතය* |
|---|---|---|
| *(ව. අ.)* | *රු. ශ.* | *රු. ශ.* |
| අත්තිවාරම් පමණක් නිමකර ඇති | 1.0 | 1.50 |
| ලින්ටල් මට්ටමට බිත්ති ඉදිකර ඇති | 2.0 | 2.50 |
| වහල මට්ටමට ඉදිකිරීම් කර ඇති | 3.0 | 3.50 |
| වහලය සෙවිලි කර ඇති | 4.0 | 4.50 |
| සම්පූර්ණයෙන්ම නිමකර ඇති | 5.0 | 5.50 |

08-405/8

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.